විෂයමාලා න්‍යාය හා භාවිතය -
දේශනය - 07
W.A. විමලසේන සර් - 2021. 11. 27
(12.30 – 3.30)

# විෂයමාලා සංවර්ධනය හා විෂයමාලා පිරිසැළසුම්




<u>විෂයමාලා සංවර්ධනය</u> -

- විෂයමාලා සංවර්ධනය පිළිබඳ අර්ථය
- විෂයමාලා පිරිසැලසුම් මූලිකාංග
    - විෂයමාලාවේ අරමුණු
    - විෂයමාලා අන්තර්ගතය
    - විෂයමාලා අත්දැකීම් (ක්‍රමවේද)
    - තක්සේරුකරණය සහ ඇගයීම

# විෂයමාලා සංවර්ධනය

නිකොල් (1978) ට අනුව විෂයමාලා සංවර්ධනය යනුවෙන් අදහස් කරනුයේ සුසුන් තුළ ඇති කිරීමට බලාපොරොත්තු වන කිසියම් චර්යාත්මක වෙනස්කම් සඳහා සුදුසු ඉගෙනුම් අවස්ථා සැලසුම් කිරීමටත් එහි වෙනස්කම් කොතෙක් දුරට සිදුවී ඇත්දැයි තක්සේරු කිරීමත් යන ක්‍රියාවලිය විෂය මාලා සංවර්ධනය යනුවෙන් අදහස් කරයි. විෂයමාලා සංවර්ධනයේදී මුලින්ම කළ යුත්තේ අදාළ මග පෙන්වීමේ සාධක ස්ථාපනය කිරීමයි.එනම්, විෂය මාලාවක් සකස් කිරීමේ මූලික පදනම (විෂයමාලා වාදය) සකස් වී ඇත්තේ දර්ශනය, සමාජ විද්‍යාව, මනෝ විද්‍යාව යන විෂය ක්ෂේත්‍ර මුල් කරගෙනය. මෙහිදී ළමයාට මුහුණ පාන ගැටලු හඳුනා ගැනීමටත් ඒවාට විසඳුම් සොයා ආත්ම ශක්තියෙන් යුතුව අභියෝගයන්ට සාර්ථකව මුහුණ දීමේ හැකියාව ලබා දීමට විෂයමාලාව තුළින් ඉගෙනුම් අවස්ථා සැලසුම් කිරීම මෙහිදී ඉතා වැදගත් වේ.

එමෙන්ම ළමුන්ගේ චින්තන ශක්තිය දියුණු කිරීම ගැටලු නිරාකරණය කර ගැනීමේ හැකියාව ලබා දීම යනාදී දර්ශන විෂයමාලාව තුළ ගැබ්වී ඇත. එමෙන්ම සමාජ විද්‍යාවෙන් ළමයාගේ හැසිරීම් රටාව සමාජයට අවශ්‍ය දැනුම් සම්භාරය යන්න තීරණය කරයි. එසේම ළමයාගේ අවස්ථා, හැකියා, ඉගෙනුම් න්‍යායන්, ඉගැන්වීමේ න්‍යායන්, පෙළඹවීමේ න්‍යායන්, පියාජේගේ බුද්ධි සංවර්ධන න්‍යායන් විෂයමාලා සංවර්ධනයේදී මුලින්ම ප්‍රතිස්ථාපනය කර ගත යුතු වේ. විෂයමාලා සංවර්ධනයේදී මූලධර්ම තේරීමේ කාර්යයේදී හා අධ්‍යාපන පරමාර්ථ තීරණය කර ගැනීමේ කාර්යය සඳහාත් ඉහත විෂයන් උපයෝගී කර ගත යුතුය.

විෂයමාලා සංවර්ධනයේදී අවධානය යෙදිය යුතු ඊළග පියවර වන්නේ විෂයමාලා න්‍යායෙන් තෝරාගත් මූලධර්ම, පරමාර්ථ ළගා කර ගැනීම සඳහා අඩංගු කළ යුතු විෂය අන්තර්ගතය, අද්දැකීම්, විධි සැලසුම් කළ යුත්තේ කවර ආකාරයටදැයි යන්න හැගවෙන විෂය මාලා ආකෘතියක් තෝරා ගත යුතුය. විෂයමාලා සංවර්ධනය යනුවෙන් අදහස් වන්නේ ඉහතින් සඳහන් කළ පරිදි විවිධ පුද්ගල හා ක්‍රියාදාමයන් ඇතුළත් ක්‍රියාවලියක් බවයි. පොදුවේ ගත්විට මෙම විෂයමාලා සංවර්ධන ක්‍රයාවලියේදී අපගේ චින්තනය නිරවුල් කිරීමට මාර්ගෝපදේශන සපයයි. ඒ අනුව විෂයමාලා සංවර්ධනයේදී පහත අධියරයන් පිළිබඳව වැඩිදුර අවධානය යොමුකිරීම වඩාත් වැදගත් වේ.

- විෂය මාලා සැකැස්ම ( ඉලක්ක, අරමුණු හා පරමාර්ථ ඇතුළත් කිරීම)
- විෂයමාලා නිර්මාණය කිරීම ( විෂය මාලාව තේරීම, අන්තර්ගතය සංවිධානය, ඉගෙනුම් අත්දැකීම් ඇතුළත් වන සේ ක්‍රියාකාරකම් ඇතුළත් කිරීම.)
- පංති කාමරය තුළ ක්‍රියාත්මක වීම. ( විෂයමාලාවේ ඇති අදහස් ක්‍රියාවට නැංවීම)
- විෂයාමාලාව තක්සේරුව ( මෙහිදී විෂයමාලාව කෙතෙක් දුරට සාර්ථකව කරුණු ඉටුවී ඇත්දැයි සොයා බැලීම)

මේ ආකාරයට විෂයමාලා සංවර්ධනය හඳුනාගත හැකිය.

## විෂයමාලා සංවිධාන රටාව

- අධ්‍යයන වැඩසටහනට අදාළ හැදෑරිය යුතු විෂය ක්ෂේත්‍රයක් දක්වා තිබීම.
- විෂයට ඇතුළත් කරුණු තීරණය කිරීම සහ විෂය විශේෂඥයින්ගෙන් විමසීම.
- එක් එක් විෂයට අදාළ පාරිභාෂික වචන (අමාරු වචන), සංකල්ප,ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රම හඳුන්වා දී තිබීම.
- ඒ ඒ විෂයට අදාළ ගවේෂණ, පරීක්ෂණ හා නිරීක්ෂණ ක්‍රම තිබීම.
- විෂයන් එකිනෙකින් හා වෙන්වෙන්ව ඉගැන්වීම හා හැදෑරීම.
- හැදෑරිය යුතු විෂය සංඛ්‍යාව දක්වා තිබීම. ඒවාට අදාළ විෂය නිර්දේශ සකස් කර තිබීම (ගුරු මාර්ගෝපදේශ/ ගුරු අත්පොත්)
- විෂයන් ඉගැන්වීමේදී වෙන්වූ කාලච්ඡේද අනුව ඉගැන්වීම් කටයුතු සිදුකිරීම
- විෂය පිළිබඳව සුවිශේෂී අධ්‍යයනයක් ලැබූ ගුරු පිරිසකට ඉගැන්වීමට අවස්ථාව සලසා දීම.
- සිසුන්ගේ ප්‍රගතිය හා සාධනය ඇගයීම. (SBA)
- විෂය කරුණු තීරණය කිරීම හා විෂය විශේෂඥයින්ගෙන් ඇසීම. (නිදසුන් - පෙළපොත් ආශ්‍රිත ගැටලු විමසීම)
- සිසුන්ගේ ප්‍රගතිය, සාධනය හා ඇගයීම සිදුකිරීම. (සම්පිණ්ඩිත, සම්භවන ආදී ඇගයීම්, මාසික පරීක්ෂණ, වාර පරීක්ෂණ, කෙටි ලිඛිත පරීක්ෂණ, SBA ආදිය)
- හැදෑරිය යුතු විෂය සංඛ්‍යාව ක්‍රමානුකූලව අඩු වීම හා විෂය කරුණු ගැඹුරට හැදෑරීමේ අවස්ථාව සැලසීම.

## විෂයමාලා පිරිසැලසුම් සහ මූලිකාංග

### විෂයමාලා පිරිසැලසුම

විෂයමාලා පිරිසැලසුමක් යනුවෙන් අදහස් කරන්නේ විෂයමාලා සැලසුමක අංග සකසන ආකාරය විෂයමාලා පිරිසැලසුම ලෙස හැඳින්වේ. මෙය සමහර අවස්ථා වලදී විෂයමාලා සංවිධානය ලෙසද හඳුන්වා දෙයි. ඒ අනුව විෂයමාලාවක මූලිකාංග සංවිධානය කරන ආකාරය තුළින් විෂයමාලා පිරිසැලසුම අපට හඳුනාගත හැකි වේ. ඒ අනුව විෂයමාලා පිරිසැලසුම් ක්‍රියාවලිය තුළ පහත දැක්වෙන මූලිකාංග හඳුනාගැනීම වැදගත් වේ.

- පරමාර්ථ, අරමුණු හා සුවිශේෂී අරමුණු තීරණය කිරීම.
- විෂය අන්තර්ගතය තොරා ගැනීම.
- ඉගෙනුම් අත්දැකීම් තෝරා ගැනීම.
- අත්දැකීම් හා විෂය කරුණු සංවිධානය හා සමෝධානය
- ඇගයීම හා තක්සේරුකරණය

- <u>පරමාර්ථ, අරමුණු හා සුවිශේෂී අරමුණු තීරණය කිරීම.</u>

විෂයමාලාවක රටක සමාජීය, වෘත්තීය අවශ්‍යතා , අපේක්ෂණ සපුරා ලිය යුතුය. ඒ අනුව සංස්කෘතික සම්ප්‍රේෂණය (සමාජ උරුමයන් බාල පරම්පරාවට පත් කිරීම/පවරා දීම), ස්වයංවිනය, ආත්මධමනය හා සමාජ ප්‍රවීනත්වය ලබා දීම පරමාර්ථ, අරමුණු තුළින් සිදුකළ යුතු වේ. එසේම ප්‍රජානන, ආවේදන හා මනෝ චාලක ෂේත්‍ර වලට අදාළ කෙටි කාලීන සුවිශේෂී අරමුණු, අත්දැකීම්ද ලබා දිය යුතු වේ. මෙය විෂයමාලාවක මූලිකාංගයක් වශයෙන්ද සඳහන් කළ හැක.

- <u>විෂය අන්තර්ගතය තෝරා ගැනීම</u>

මෙහිදී උගන්වන විෂය තුළ ඇතුළත් වන විෂය කරුණු විෂය මාලාවක ඉතා පැහැදිළිව සඳහන් කර යුතු වේ. මෙය විෂය අරමුණු සමග එකිනෙක බැඳී පවතී. එමෙන්ම සරළ බවේ සිට සංකීර්ණ විෂය කරුණු කරා විෂය අන්තර්ගතය ඇතුළත් කළ යුතු වේ.

ඕනෑම විෂයක විෂය කරුණු තෝරා ගැනීමේදී සැලකිල්ලට ගත යුතු මූලධර්ම තුනක් ඇත. ඒ අනුව,

1. අනුපිළිවෙල
2. ක්‍රියාකාරකම්
3. සමෝධානය

මෙම මූලධර්ම වලට අනුව විෂය කරුණු තෝරා ගැනීමේදී සැලකිලිමත් වියයුතු බව පැහැදිළි වේ.

- <u>විෂයමාලා ඉගෙනුම් අත්දැකීම් තෝරා ගැනීම.</u>

චර්යාමය වෙනසක් ඇති කිරීම සඳහා ඉගෙනුම් අද්දැකීම් තෝරා ගැනීම මෙහිදී ඉතා වැදගත් වේ. මෙම අද්දැකීම් තෝරාගත යුත්තේ / හඳුනාගත යුත්තේ පොදු පරමාර්ථ, අරමුණු, සුවිශේෂී අරමුණු තුළින්ය. සිසුවා දැනුම, ආකල්ප හා කුසලතා ආශ්‍රිතව හොඳ පුද්ගලයෙකු බිහි කිරීමට චර්යාත්මක අද්දැකීම් ලබා දීම, තීරණය කිරීම මෙහිදී ඉතා වැදගත් වේ.

නිදසුන් -

ආර්ථික ක්ෂේත්‍රයේ කාර්යක්ෂම නිෂ්පාදකයෙකු බිහි කිරීමට නම් අධ්‍යාපන පරමාර්ථ අරමුණු සුවිශේෂී අරමුණු අවශ්‍ය දැනුම, කුසලතා, ආකල්ප ඒ අනුව දිශානුගතව සකසා ගත යුතුය. ඒ තුළින් හොඳ නිෂ්පාදකයකු බිහිකරගත හැකිය.

- <u>අත්දැකීම් හා විෂය කරුණු සංවිධානය හා සමෝධානය</u>

මෙම පියවරේදී 2 සහ 3 පියවරවල ආවරණය කළ තොරතුරු සම්බන්ධ කිරීම අපේක්ෂා කරයි. එනම් විෂය අත්දැකීම් ලබා දීම සිදු කරයි.

නිදසුන් - හර විෂය මාලාව,ක්‍රියාකාරී විෂය මාලාව ආදී ලෙස ඉගෙනුම් අද්දැකීම් සංවිධානය කර ලබා දීමට උත්සාහ කරයි.

එමෙන්ම ක්‍රියාකාරී අත්දැකීම් ලබාදීමට ක්‍රියාකාරී විෂය මාලාව ඉදිරිපත් කරයි. ඒ අනුව හර විෂය මාලාවට අමතරව පොදු අද්දැකීම් හා විශේෂ අද්දැකීම් ලබා දීමට එම විෂය කරුණු සංවිධානය කිරීමට සකස් වූ විෂය මාලාවක් ක්‍රියාත්මක කරයි.

එපමණක්ද නොව ප්‍රාථමික ශ්‍රේණිවල විෂය මාලාව තුළ සමෝධානික විෂයන් ලබා දීමට සකස්වන විෂය මාලාවක් ද වේ. නව ප්‍රාථමික විෂය මාලාවේ සමෝධානික අත්දැකීම් ලබාදීමට විෂය මාලාව සකස් කරගත හැකි බව අපට පැහැදිලි වේ.

- <u>ඇගයීම හා තක්සේරුකරණය.</u>

අධ්‍යාපන ක්‍රියාවලිය තුළ(ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය තුළ) සාර්ථක හෝ අසාර්ථක භාවය නිගමනය කළ හැක්කේ චර්යාවේ වෙනස්වීමක් පිළිබඳව යම් කිසි ඇගයීමක් සිදු කිරීමෙන් පසුවය. විෂය මාලාව සැලසුම් කළ අවස්ථාවේ සිට අපේක්ෂා කළ චර්යාවේ ඇතිවේයැයි බලාපොරොත්තු වූ දැනුම, ආකල්ප හා කුසලතා ශිෂ්‍යයන් ඇති කර තිබේදැයි පරීක්ෂා කිරීමක් ඇගයීම් ක්‍රියාවලිය තුළින් සිදුකළ යුතුය. විෂයමාලාවකද මෙය පොදු ලක්ෂණයක් ලෙස සඳහන් කළ හැකිය. ඇගයීම තුළින් විශය සමෝධානය වඩාත් හොදින් සිදුවී ඇතිදැයි නියාමය (නිතර නිතර සිදුකිරීම) කළ හැක.

<u>ප්‍රශ්නය</u> -

1. විෂයමාලා සංවර්ධනය යන අර්ථය ඔබේ වචනයෙන් පැහැදිලි කරන්න.
2. විෂය මාලා පිරිසැලසුම යන්නෙන් අදහස් කරන්නේ කුමක්දැයි දක්වා පිරිසැලසුමේ මූලිකාංග මොනවාද ?